# CONFLICT AND CONFLICT RESOLUTION

## (Part III)

# ගැටුම් සමථන මාධ්‍ය

ගැටුම් සමථන ක්‍රියාවලියේ දී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය 4 කි.

1. සහමන්ත්‍රණය
2. මැදිහත්කරණය
3. සාම ගිවිසුම්
4. සාමය ගොඩනැඟීම

ClassWork.LK

# සහමන්ත්‍රණය (Negotiation)

*Getting to Say 'yes'* නම් සහමන්ත්‍රණය පිළිබඳ ව සුප්‍රසිද්ධ අත්පොත ලියූ රෝජර් ෆිෂර් (Roger Fisher) ගේ සහ විලියම් යූරි (William Ury) ගේ නිර්වචන අනුව, සහමන්ත්‍රණය යනු ''අපට අන්‍යයන්ගෙන් ලබා ගැනීමට වුවමනා දේ ලබා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍යයකි. ඔබ සහ අනෙක් පාර්ශ්වය අතර බෙදා ගත හැකි පොදු අභිලාෂ මෙන් ම පටහැණි අභිලාෂ ද පවතින විට, දෙපාර්ශ්වය අතර එකඟතාවක් ඇතිකර ගැනීම අරමුණු කොට ගෙන සිදුවන සන්නිවේදන හුවමාරුව සහමන්ත්‍රණය යි''

ClassWork.LK

''සහමන්ත්‍රණය'' යනු ගැටුමක යෙදී සිටින පාර්ශ්ව තම ගැටුම විසඳා ගැනීම සඳහා යොදා ගන්නා සාකච්ඡාමය ක්‍රියාවලියකි.

''සහමන්ත්‍රණය'' යනු එකිනෙකට ගැටෙන පොදු ස්ථාවරයක් බවට පත් කර ගැනීම සඳහා ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර ඇතිවන ක්‍රියාවලිය යි.

සහමන්ත්‍රණය සිදු කරන ආකාර තුනක් ගැටුම් සමථකරණ සාහිත්‍යයේ දැක්වේ.

## a. ගැටුම් විසඳා ගැනීම් සහමන්ත්‍රණය (Problem Solving Negotiation)

මෙහි දී සිදුවන්නේ ගැටුමේ පාර්ශ්වවලට පොදුවේ පිළිගත හැකි විසඳුමක් සොයා යෑම යි. එය පාර්ශ්ව දෙකට ම සතුටු විය හැකි, අතරමැද සමාදානකාරී විසඳුමක් හවුලේ සොයා ගැනීමේ ක්‍රියාවලියකි. එය සිදු වන්නේ ගැටුමට පාදක වූ ගැටලු විසඳීමට එකඟ වීමෙනි.

ClassWork.LK

## b.ආරාවුල්කාරී සහමන්ත්‍රණය (Contending Negotiation)

මෙහි දී සිදුවන්නේ ගැටුමට සම්බන්ධ එක පාර්ශ්වයක්, අනෙක් පාර්ශ්වය මත තම ස්ථාවරය පැටවීම සඳහා සාකච්ඡාවේ යෙදීම යි. තම ස්ථාවරය නම්‍යශීල නොකර දැඩි ලෙස පවත්වා ගනිමින්, පසමිතුරු පාර්ශ්වයේ ස්ථාවරය තමන්ට වාසි ලෙස වෙනස් කිරීමට බල කිරීම මෙහි දී කෙරේ.

## c. නම්‍යශීලී සහමන්ත්‍රණය (Yielding Negotiation)

මේ ක්‍රමයේ දී සිදුවන්නේ, ගැටුමට සම්බන්ධ පාර්ශ්ව, විසඳුමක් සොයා ගැනීම සඳහා තම අරමුණු හා අපේක්ෂා පිළිබඳ ව නම්‍යශීලී වීම යි.

ClassWork.LK

මැදිහත්කරණය (Mediation)

මැදිහත්කරණය යනු ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර විවාදයට තුඩු දී ඇති නිමිති සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට ම පිළිගත හැකි නිරාකරණයක් (Settlement) ඇති කිරීමේ අරමුණින් තුන්වැනි පාර්ශවයක් භාරගෙන තිබෙන අතරමැදි ක්‍රියාකාරකමක.මැදිහත්කරණය එක අවස්ථාවක සිදුවන එක ක්‍රියාකාරකමක් නොව ක්‍රියාවලියකි. එය අවධි කීපයකින් යුක්ත වේ.

I. මුලදී ගැටුම් පාර්ශව අතර පණිවිඩකරුවකු ලෙස ක්‍රියා කිරීම.
II. ඔවුන් අතර සාධනීය අදහස් හුවමාරුවකට අවශ්‍ය සන්නිවේදන මාධ්‍යය වීම හා ඒ සඳහා ආධාර සැපයීම.
III. ගැටුමට විකල්ප විසඳුම් ගැන සිතීමට ආධාර වීම.
IV. ගැටුමේ පාර්ශ්ව සාකච්ඡා මේසයට ගෙන ඒම සහ සාකච්ඡාවල සභාපති කාර්ය ඉටුකිරීම.

ClassWork.LK

V. සහමන්ත්‍රණයේ දී ඇති වන ගැටලුකාරී කරුණු විසඳීමට පාර්ශ්වකරුවන්ට ආධාර කිරීම.

VI. සහමන්ත්‍රණයේ යෙදෙන පාර්ශ්වවල ප්‍රකාශකයා ලෙස කටයුතු කිරීම.

VII. සාම ගිවිසුම කෙටුම්පත කිරීමට ආධාර කිරීම.

VIII. සාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට, පාර්ශ්ව කරුවන් ඉල්ලා සිටින උදවු ලබා දීම.

ClassWork.LK

# සාම ගිවිසුම්

රාජ්‍ය අභ්‍යන්තර හෝ අන්තර් රාජ්‍ය හෝ ගැටුමක් පවතින විට, සහමන්ත්‍රණයේත්, මැදිහත්කරණයේත් අපේක්ෂාව වන්නේ ගැටුමේ පාර්ශව කරුවන් සාම ගිවිසුමකට නැතහොත් නිරාකරණ ගිවිසුමකට (Peace Agreement/Settlement Agreement& අත්සන් කරනු ඇත යන්නයි. සාම ගිවිසුම (Peace Accord) යන පදය ද මේ සඳහා යොදා ගැනේ.

තුන්වැනි පාර්ශවයක මැදිහත්කරණය සිදුවන අවස්ථාවක සාම ගිවිසුමට ගැටුම් පාර්ශව කරුවන් අත්සන් කරන්නේ, එම තුන්වැනි පාර්ශ්වයේ සහභාගිත්වය සහ අනුශාසනා පරිදි ය. ගිවිසුම කෙටම්පත් කිරීමටද තුන්වැනි පාර්ශවය සහභාගී වෙයි. මැදිහතක්රණය නොමැති අවස්ථාවල පාර්ශ්ව දෙකේ විශේෂඥයෝ ගිවිසුම කෙටුම්පත් කරති.

ගැටුමක් ඒක පාර්ශ්වික ව අවසන් වූ අවස්ථාවක, සාම ගිවිසුම අස්සන් කරන්නේ නැත. එවැනි අවස්ථාවක බොහෝ විට සිදුවන්නේ පරාජිත පාර්ශ්වය යටත් වීමේ ගිවිසුමක් අත්සන් කිරීම යි. එය සාම ගිවිසුමක් නොවේ.

ClassWork.LK

# සාම ගිවිසුමක ලක්ෂණ

I. ගැටුමේ පාර්ශ්ව දෙක ම, ගැටුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හෝ එකඟ වීම.

II. තනි ව මත් හවුලේත් ක්‍රියාත්මක කිරීමට එකඟ වන පොරොන්දු සාම ගිවිසුමේ කොන්දේසි බවට පත් කිරීම.

III. ගැටුම් සිවිල් යුද්ධයක්නම් යුද්ධය අවසන් කිරීම, නිරායුධකරණය, සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම, යුද්ධයෙන් සරණාගතයන් වූ සිවිල් ජනයා යළි පදිංචි කරවීම, මානව අයිතිවාසිකම් කඩවීම්වලට පිළිතුරු සෙවීම ආදි කාර්යයන්ට හවුලේ එකඟ වීම.

IV. කැරලිකාර පාර්ශ්වය දේශපාලන ප්‍රධාන ප්‍රවාහයට එකතු කර ගැනීම සහ එම පාර්ශ්වයේ දේශපාලන ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් දේශපාලන ප්‍රතිසංස්කරණවලට එකඟ වීම.

V. ගිවිසුම් කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට ශපථ වීම සහ ඒ සඳහා ස්වාධීන නිරීක්ෂණ විධිවිධානවලට එකඟ වීම.

Classwork.LK

# සාමය ගොඩ නැගීම

සාම ගිවිසුමකට පාර්ශ්වකරුවන් එළඹීම, සාමය ගොඩ නැගීමේ දීර්ඝ ක්‍රියාවලියක ආරම්භය පමණි. විශේෂයෙන් ම ප්‍රචණ්ඩ සහ දිග්ගැස්සුණු සිවිල් යුද්ධ පැවති සමාජවල සාමය ගොඩනැගීම ද දීර්ඝ කාලීන සහ පරිවර්තනීය ක්‍රියාවලියක් වේ. සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අභියෝග දෙකකි.

I. සාම ගිවිසුමේ පාර්ශව එකඟ වූ කොන්දේසි නිසි පරිදි හා පොරොන්දු වූ පරිදි ක්‍රියාත්මක කිරීම.

II. ගිවිසුම අසම්පූර්ණ ලෙස ක්‍රියාත්මක වීමේ දී ඇතිවිය හැකි ගැටුමට ආපසු යාමේ හැකියාව පාලනය කිරීම.

ClassWork.LK

ClassWork.LK